# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2023-01-31


පැමිණිලිකරු : පී.ඩී.එන්.ඩබ්. ගමගේ මයා,
කෙවිටියාගල,
පොල්ගම්පල.

වගඋත්තර පාර්ශවය : 01 විදුහල්පති,
සී.ඩබ්.ඩබ්.කන්නන්ගර ජාතික පාසල,
මතුගම.

02 විදුහල්පති,
තක්ෂිලා ජාතික පාසල, හොරණ.
(2020 පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට අදාළ
අභියාචන මණ්ඩල සභාපති)

03 අධ්‍යක්ෂ, ජාතික පාසල් ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : HRC/755/20</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම =:**

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, තම කණිටු පුත්‍රයා 2020 වසරේ මතුගම සී.ඩබ්.ඩබ්. කන්නංගර ජාතික පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා සහෝදර පදනම මත අයදුම්පත්‍රයක් යොමු කර බීආර් 59 යටතේ අදාළ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ඉන් මුළු ලකුණු 83 ක් ලබා ගත් බවත්, කෙසේ




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman — 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி — 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் — 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு — 1996
වෙබ් / இணையம் — www.hrcsl.lk

වෙනත් තාවකාලික ලේඛන ප්‍රසිද්ධ කිරීමේදී තම දරුවාට සහෝදර පදනම යටතේ ලකුණු 74 ක ප්‍රමාණයක් ලබාදී තිබූ බව සඳහන් කර තිබූ බවත් ඒ අනුව තමා අදාළ පොරොත්තු ලේඛනයේ නෙවන ස්ථානයට ස්ථාන ගත කර තිබූ බවත්ය.

ඉන් පසුව මේ සම්බන්ධව විදුහල්පතිවරයා ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කළද ඉන් සහනයක් සලසා ගැනීමට හැකියාවක් නොවූ බැවින් අභියාචනා විරෝධතා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවද සඳහන් කර ඇත. ඒ අනුව අභියාචනා විරෝධතා පරීක්ෂා කිරීමේදී එම මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් විසින් පෙර ලබාදී තිබූ ලකුණු 83 ක ප්‍රමාණය තමන් වෙත හිමි වියයුතු බවට තීරණය කළ බවද සඳහන් කර ඇත. සහෝදර පදනම යටතේ කත්තනිගර ජාතික පාසලේ එම වසරේ පළමු ශ්‍රේණිය සඳහා දරුවන් 19 දෙනෙකු ඇතුළත් කර ගැනීමට නියමිතව තිබී ඇති අතර, 8 වන ස්ථානයට මුළු ලකුණු 83 ක් ලබා ගත් සිසුන් 5 දෙනෙකු අතර තම දරුවාද සිටි බව පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත.

2020-01-16 වන දින පළමු ශ්‍රේණියට ඒ ඒ ගණ වලින් දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා දෙමාපියන් වෙත දන්වා තිබූ අතර, තමන් වෙත එම දැන්වීම නොලැබුණු බැවින් විදුහල්පතිවරයාගෙන් ඒ සම්බන්ධව විමසීමක් සිදු ක බවත් පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය වෙතින් ලබාදී තිබෙන තීන්දුව ඉදිරියේදී වෙනස් කිරීමට නියමිත බවත්, ඒ අනුව පන්තියක සිටිය යුතු උපරිම සිසුන් සංඛ්‍යාව 40 දක්වා වැඩි කිරීමට නියමිත බවත්, ඒ අනුව ඉදිරියේදී තම දරුවා මතුගම කත්තනිගර ජාතික පාසලේ 2020 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට හැකියාව පවතින බවත් විදුහල්පතිවරයා තමා සමග පැවසූ බවද දක්වා ඇත. මේ සම්බන්ධව ඉන් පසු අවස්ථා කිහිපයකදී විදුහල්පතිවරයා මුණ ගැසී විමසීමේදී පෙර පරිදිම බලාපොරොත්තු ඇති වන ආකාරයෙන් කරුණු ඉදිරිපත් කළ බවද පසුව තමා විසින් ඒ සම්බන්ධව ජාතික පාසල් අධ්‍යක්ෂවරයා මුණ ගැසී කරුණු ඉදිරිපත් කර තිබූ බැවින් විදුහල්පතිවරයා ඒ සම්බන්ධව උරනව සිටි බව තමන්ට හැඟී ගිය බවත්, තම බිරිඳ විසින් 2020-02-14 වන දින විදුහල්පතිවරයා හමුවී අභියාචනා මණ්ඩලය පිරිනමා ඇති ලකුණු වලට අනුව තම දරුවා පළමු ශ්‍රේණියට ඇතුළත් කර නොගත්තේ ඇයිදැයි විමසීමේදී ජාතික පාසල් අධ්‍යක්ෂ මගින් එම කටයුත්ත ඉටු කර ගන්නා ලෙස තර්ජනාත්මකව ප්‍රකාශ කර ඇති බවත් සිය පැමිණිල්ල මගින් වැඩිදුරටත් පවසා ඇත.

තවද අභියාචනා විරෝධතා මණ්ඩල සභාපති හෝ සාමාජිකයින්ගේ තීරණය පිළිබඳව විමසීමේදී තමන් එම උපදෙස් පිළිනොගන්නා බව ප්‍රකාශ කළ බවද එම තත්වය මත 2020 වසරේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමට අදාළ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති

29/2019 චක්‍රලේඛනය උල්ලංඝනය වන ආකාරයෙන් කත්තංගර ජාතික පාසලේ විදුහල්පතිවරයා කටයුතු කර ඇති බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සලසා දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බව දක්වා සිටින අතර, මේ සම්බන්ධව කඩිනම් විමර්ශනයක් සිදු කර තම දරුවා ඉහත පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා වගඋත්තරකරුවන් වෙත නිර්දේශයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු දැක්වීම =:

01 විදුහල්පති සි.ඩබ්.ඩබ්. කත්තන්ගර විද්‍යාලය, මතුගම කරුණු දැක්වීම

ඉහත පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින්, විදුහල්පති, කත්තන්ගර ජාතික පාසල, මතුගම එම්.ඩබ්.එස්.සි වීරසිංහ මහතා ප්‍රකාශ කර ඇත්තේ, උක්ත පැමිණිලිකරු වන පී.ඩී.එන්.ඩබ්. ගමගේ මහතා සිය පුත්‍රයා බීආර් 59 අංකය යටතේ සහෝදර පදනමින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී මුළු ලකුණු 83 ක් ලබා ගත් බවත්, සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සිදු කර ඇති ස්ථානීය පරීක්ෂාවට අනුව පාසලේ සිට නිවසට දුර ගණනය කිරීමේදී ආසන්න පාසල් 3 කට ලකුණු අහිමි වූ බවත්, ඒ අනුව මුළු ලකුණු සංඛ්‍යාව 74 දක්වා අඩු වූ බවත්, එම ලකුණු අඩු කිරීම චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි සිදු කර ඇති බවත්ය.

2020 වසරේ සහෝදර ගණය යටතේ තම පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට අදාළ ඉහළම ලකුණු ලබා ගෙන ඇති සියළුම අයදුම්කරුවන්ගේ පදිංචි ස්ථාන සම්බන්ධව ස්ථාන පරීක්ෂාවන් සිදු කර ඇති බවත්, ඒ අනුව මෙම පැමිණිලිකරු ඇතුළු තවත් අයදුම්කරුවන්ගේ පෙර ලකුණු වල වෙනස්කම් සිදුව ඇති බවත් සඳහන් කර ඇත. තවද පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ තාවකාලික ලේඛනය ප්‍රදර්ශනය කිරීමෙන් පසු එහි අවසානයේ චක්‍රලේඛනයට අනුව දින 14 ක් ඇතුළත් අභියාචනා/ විරෝධතා ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු වන නමුත් ඉහත පැමිණිලිකරු අභියාචනයක් හෝ එම ආකෘතියට අනුව ඉදිරිපත් කිරීමක් සිදු කර නොමැති බවත් විරෝධතා ලිපියක් පමණක් ඉදිරිපත් කර ඇති අතර, එයද චක්‍රලේඛයේ සඳහන් ආකෘතියට අනුව ඉදිරිපත් කර නොමැති වුවත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අභියාචනා හා විරෝධතා මණ්ඩලයට එම ලිපිය යොමු කර ඇති බවත් චක්‍රලේඛය ප්‍රකාරව අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ තීරණය අනුව අවසාන ලේඛනය සකසා ඉදිරිපත් කර ඇති බවත් දක්වා ඇත. එහිදී පැමිණිලිකරුගේ ඉහත විරෝධතා ලිපියද සැලකිල්ලට ගෙන නාම ලේඛන වල අඩුපාඩුවක් ඇත්නම් ඒ පිළිබඳවද සැලකිලිමත් වී ඇති බවත්, ඒ අනුව තමන් හෝ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් මෙහිදී කටයුතු කර නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

**02 අධ්‍යක්ෂ (ජාතික පාසල් ශාඛාව) අධ්‍යාපන අමාත්‍යාංශය කරුණු දැක්වීම**

ඉහත පැමිණිල්ලට අදාලව කරුණු ඉදිරිපත් කරමින්, ජාතික පාසල් අධ්‍යක්ෂ නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සඳහන් කර ඇත්තේ, එවකට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පැමිණිලිකරුගේ පුත්‍රයා කත්තංගර ජාතික පාසලේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇති බවත්, එවකට අධ්‍යාපන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා වෙත ද පැමිණිලිකරු විසින් මේ සම්බන්ධව සිදු කර ඇති ඉල්ලීම සලකා බලා ඒ සම්බන්ධයෙන් ද සලකා බැලීමක් සිදු කරන ලෙස හිටපු අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ද ජාතික පාසල් අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව දන්වා ඇති බවත්ය. එහිදී පරීක්ෂණ නිලධාරි නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය වෙත වැඩිදුරටත් දන්වා ඇත්තේ ජාතික පාසල් අධ්‍යක්ෂවරයා මෙම කාරණය සම්බන්ධව නැවත වරක් දැනුවත් කර පැමිණිලිකරුගේ පුත්‍රයා ඉහත පාසලේ සමාන්තර ශ්‍රේණියකට ඇතුලත් කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සාකච්ඡා කර ඒ සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කඩිනමින් ලිඛිත කරුණු දැක්වීමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසයි.

**03 අභියාචනා විරෝධතා මණ්ඩල සභාපතිවරයාගේ කරුණු දැක්වීම**

පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇති පරිදි තම දරුවාගේ නම සහෝදර පදනම යටතේ පාසලට ඇතුලත් කර ගන්නා දරුවන්ගේ නාම ලේඛනයේ නොමැති තත්වය තුළ අභියාචනා විරෝධතා මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව පෙර ලබාදී ඇති ලකුණු 83 ක ප්‍රමාණය අභියාචනා විරෝධතා මණ්ඩල සභාපති ලෙස කටයුතු කර ඇති හොරණ තක්ෂිලා ජාතික පාසලේ විදුහල්පතිනි ජයතිලක මිය ඇතුළු අභියාචනා විරෝධතා මණ්ඩලය විසින් ද සිය අභියාචනය සලකා බැලීමෙන් අනතුරුව ලබාදී ඇති බවට ලිඛිත සහ වාචික සාක්ෂි මගින් ඉදිරිපත් කර තිබූ බැවින් ඒ සම්බන්ධව විමසීම සඳහා ජයතිලක මිය විදුහල්පති, හොරණ තක්ෂිලා ජාතික පාසල අවස්ථා දෙකකදී පරීක්ෂණ වලට කැඳවා ඇතත් හේතු නොදන්වා එම පරීක්ෂණ වලට සහභාගි වී නොමැත.

**විමර්ශනය =:**

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු අනුව පැමිණිලිකරුගේ දරුවා සහෝදර පදනම මත මතුගම සී.ඩබ්.ඩබ් .කන්නනරගර මධ්‍ය මහා විදුහලේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිමින් ලකුණු 83 ක් ලබා ගෙන ඇති අතර, එය සනාථ කිරීමට පැමිණිලිකරු ලේඛන ඉදිරිපත් කර ඇත.

2019.11.18 දින ප්‍රසිද්ධ කරන ලද සහෝදර පදනම මත බඳවා ගන්නා සිසුන්ගේ නාමලේඛනයේ බීආර් 59 යටතේ පැමිණිලිකරු ලකුණු ගණන 74 සේ දක්වා ඇති බවත්, පාසලට ඇතුළත් කර ගැනීමේ පොරොත්තු ලේඛනයට නම ඇතුළත් වී තිබූ බවත් දක්වා ඇත. ප්‍රසිද්ධ කරන ලද සිසුන්ගේ නාමලේඛනයේ තොරතුරු නිවැරදි නොවන බව සඳහන් කළද, එය නිවැරදි කිරීමට විදුහල්පතිවරයා ක්‍රියාකර නොමැති අතර, පැමිණිලිකරුද ජාතික පාසල් අධ්‍යක්ෂවරයා වෙත හා අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා කර ඇත.

අභියාචනා මණ්ඩලයේ තීරණය අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දෙන ලද ලකුණු 83 නිවැරදි බව තීරණය වී ඇති බව නිරීක්ෂණය වන අතර, සහෝදර පදනම මත ලකුණු 76 ක් ලබා ගෙන ඇති දරුවන්ද පාසලට ඇතුළත් වී ඇති බැවින් පැමිණිලිකරුගේ දරුවා ඇතුළත් නොවීම පැමිණිලිකරුට අසාධාරණයක් සිදු වී ඇති බැව් නිරීක්ෂණය වේ.

ඒ සම්බන්ධව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කර ඇති විදුහල්පති වීරසිංහ මහතා සිය ලිඛිත කරුණු දැක්වීමෙහි කිසිදු සඳහනක් සිදු කර නොමැත. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීම් අනුව පැමිණිලිකරුගේ පුත්‍රයා වෙත සහෝදර ගණය යටතේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී මුළු ලකුණු 83 ක් ලැබී ඇති අතර, එම ලකුණු ප්‍රමාණය නිවැරදි බව අභියාචනා විරෝධතා මණ්ඩලය ද සනාථ කර ඇති බව නිරීක්ෂණය වේ.

29/2019 චක්‍රලේඛයේ 12/8 වගන්තියේ සඳහන් කර ඇති පරිදි " අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කරන ලද යම් අයදුම්කරුවෙකු පිළිබඳව අභියාචනා හා විරෝධතා මණ්ඩලය විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය වනු ඇත" යනුවෙන් සඳහන් කර ඇත.

**නිගමනය =:**

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු සහ ඒ සම්බන්ධයෙන් ඉහතින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණයන්ද සැලකිල්ලට ගැනීමේදී වගඋත්තරකරු ලෙස සඳහන් කර ඇති විදුහල්පති ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරු වන පී.පී.එන්.ඩබ්. ගමගේ යන අය වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති නීතිය ක්‍රියාත්මක කිරීම සාධාරණව සිදුවියයුතුය යන්න උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරමි.

නිර්දේශය =:

ඉහත නිගමනය අනුව වගඋත්තර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති හේතුවෙන් පැමිණිලිකරුගේ පුත්‍රයා වන නදුන් විකසිත ගමගේ දරුවා මතුගම සී.ඩබ්.ඩබ් කන්නන්ගර ජාතික පාසලේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කර ගැනීමට කටයුතු කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා මගින් වගඋත්තරකරුවන් වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.02.28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 1. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/